www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, සමාජවාදය හා දේශගුනික විපර්යාස

## Marxim, socialism and climate change

**නික් බීම්ස් විසිනි**

2009 දෙසැම්බර් 22

*පසුගිය සතියේ ලෝක සමාජවාදී වෙබ් අඩවිය හා ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂය විසින් සිඩ්නි හා මෙල්බර්න් නගරවල දී පවත්වන ලද රැස්වීම් තුල, විමෝචන හුවමාරු යෝජනා ක්‍රමය හා දේශගුනික විපර්යාස පිලිබඳ "විවාදය" පිටුපස ඇති සැබෑ න්‍යාය පත්‍රය හෙලිදරව් කරනු ලැබිනි.*

*ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජික හා ඔස්ට්‍රේලියාවේ සසප ජාතික ලේකම් නික් බීම්ස් ද ලෝසවෙඅ ලේඛක පැට්‍රික් ඕ කොනර් ද, රැස්ව සිටි ශිෂ්‍යයන්, කම්කරුවන්, වෘත්තිකයන් හා විශ්‍රාමිකයන් හමුවේ, "විමෝචන හුවමාරු යෝජනා ක්‍රමයේ ආර්ථික හා දේශපාලනය, සමාජවාදය හා දේශගුනික විපර්යාස" පිලිබඳ දේශන දෙකක් පැවැත්වූහ.*

*දේශගුනික විපර්යාස පිලිබඳ කෝපන්හේගන් සමුලුව වසාගෙන පැවති ජාතික ගැටුම් හා එදිරිවාදිකම්වල පසුබිමට විසංවාදීව, වර්ධනය වන පාරිසරික හා සමාජ ව්‍යසනය වලක්වාගත හැකි දැවැන්ත සම්පත් හා තාක්ෂනය මෙහෙයවිය හැක්කේ, ආර්ථික ජීවිතය සමාජවාදී ආකාරයකින් ජාත්‍යන්තර පරිමානව ප්‍රති සංවිධානය කිරීම මගින් පමනක් බව එම වාර්තා මගින් පෙන්වා දුන්නේය.*

*පහත පලවන්නේ නික් බීම්ස් ඉදිරිපත් කල වාර්තාවයි.*

ගෝලීය දේශගුනික විපර්යාසවල බලපෑම් පිලිබඳ ප්‍රශ්නය තුල පරදුවට තැබී ඇත්තේ, මානව ශිෂ්ඨාචාරයේ ම අනාගතයට නොඅඩු දෙයක් යයි මේ රැස්වීම තුල කරන සාකච්ඡාව මගින් සැලිකිල්ලට ගනු ලබයි. ගැටලු කෙතරම් ප්‍රගාඪ හා දුරදිග යන ඒවා ද කිවහොත්, ඒවාට විසඳුම් සෙවීමේදී සියලු ආර්ථික, ද්‍රව්‍යමය, විද්‍යාත්මක හා තාක්ෂනික සම්පත් ප්‍රයෝජනයට ගත යුතුව ඇත.

වර්තමාන තත්වය ඉතා ඉක්මනින් ආපසු නො හැරවුවහොත් මානව වර්ගයා ව්‍යසනයකට මුහුන දෙනු ඇත. මෙය එක් සිද්ධියක් පමනක් නොවනු ඇත. නියඟය, වඩ වඩාත් ප්‍රචන්ඩ වන කාලගුනික සිදුවීම්, මහා ජන සංක්‍රමන, භූමිය හා ජල සම්පත් මුල්කොටගත් ගැටුම් හා න්‍යෂ්ටික අවි පවා යොදාගන්නා යුද්ධ ද ඇතුලුව එය, සමාජ හා ආර්ථික කොන්දේසි තව තවත් නරක අතට හැරවීමක් ද වනු ඇත.

යමෙක් වැරදීමකින් හෝ, මා යම් ආකාරයක සමාජවාදී නාස්ථිකවාදියෙක් යයි සිතාගැනීම වැලැක්වීම සඳහා, මූලෝපායික හා ජාත්‍යන්තර අධ්‍යයන කේන්ද්‍රය (සීඑස්අයිඑස්) නමැති ඉහල පෙලේ ඇමරිකානු බුද්ධි ආයතනයක් විසින් පලකල වාර්තාවකින් උපුටා දැක්වීමට මට අවසර දෙන්න. එය සකස් කලේ 2007 නොවැම්බර් මාසයේ ය.

"පෘතුවි ගෝලය උනුසුම්වීමේ සමහර ප්‍රතිවිපාක කෙතරම් වේගයෙන් දිගහැරෙන්නේ ද යන්න පිලිබඳව විද්‍යාත්මක ප්‍රජාව සිය තිගැස්ම පලකොට තිබේ. එය අදහස් කරන්නේ, වඩාත්ම ශක්‍ය යයි සලකනු ලබන බොහෝ ගනන් බැලීම් ඕනෑවට වඩා තත්වාරක්ෂක බවය." යනුවෙන් වාර්තාව අදහස් පල කරයි. එම නිගමනය වෙනස් කරන කිසිවක් පසුගිය දෙවසර තුල සිදුව නැත. සත්‍යය නම් සීඑස්අයිඑස් සඳහන් කර තිබෙන ප්‍රවනතාවය වඩාත් නිශ්චිත වී තිබීම යි. දේශගුනික විපර්යාසයේ අපේක්ෂිත දරුනු විනාශකාරීත්වයෙහි පදනම මත අවස්ථාවන් තුනක් වාර්තාවෙන් ගෙනහැර දක්වයි.

2040 වසර වන විට සාමාන්‍ය ගෝලීය උෂ්නත්වය සෙල්සියස් අංශක 1.3 න් ඉහල යන්නේය යන පදනම මත, අපේක්ෂිත අවස්ථාවන් යටතට ගැනෙන්නේ, "මහා පරිමාන ජන සංක්‍රමනයන් හේතුකොටගෙන (රටවල් තුල) අභ්‍යන්තරික හා දේශසීමා හරහා උත්සන්න වන ආතතීන්, සම්පත් හිඟකම නිසා ඇවිලෙන ගැටුම්, විශේෂයෙන්ම අප්‍රිකාවේ දුබල හා අසාර්ථක රාජ්‍යයන්හි, ආර්ථික ප්‍රතිවිපාක ගෙනඑනු ලබන වසංගත පැතිරීමේ ඉඩකඩ වැඩිවීම හා, සම්පත් මාරුකිරීමටත් වසංගත පැතිරයාමටත් අනුකූලව හැඩගැසීමට ජාතීන් උත්සාහ දරන අතරතුර ඇතිවන සමහර භූදේශපාලනික ප්‍රතිනියමයන්"ය.

මෙසේ ලියා ඇත්තේ එක්සත් ජනපදයේ ආන්ඩු බලධාරීන්ට උපදෙස් සපයන ජාතික ආරක්ෂක බුද්ධි මන්ඩලයක් විසින් බව සිහියට නගාගන්න. එබැවින් එය "භූදේශපාලනික ප්‍රතිනියමයන්" ගැන සඳහන් කරන විට ඉන් අදහස් කරන්නේ, ඉරාකය හා ඇෆ්ගනිස්ථානය තුල සිදු කෙරෙමින් තිබෙන වර්ගයේ ක්‍රියාවලියකි.

සිදු නොවිය හැක්කක් නොවන, දරුනු දේශගුනික විපර්යාස පිලිබඳ අවස්ථාව යටතේ, 2040 වන විට සෙල්සියස් අංශක 2.6 න් ගෝලීය සාමාන්‍ය උෂ්නත්වය වැඩිවන කල "ගෝලීය වාතාවරනය තුල රේඛීය නොවන දැවැන්ත සිදුවීම්, එවැනි ම දැවැන්ත සමාජීය සිදුවීම් නැඟී ඒමට තුඩුදෙනු ඇත. වසංගත රෝග වැනි වෙනස්වන පරිමානයේ හා ව්‍යසනකාරී අභියෝග මඟින් ලොව පුරා ජාතීන් වසාගනු ඇත." යනුවෙන් වාර්තාව අනතුරු අඟවයි. එක්සත් ජනපදය ද ඇතුලු අනෙකුත් ජාතීන්ගේ ද අභ්‍යන්තර එකමුතුව, සංක්‍රමනයේ, කෘෂිකාර්මික රටාවන්ගේ හා ජල සම්පාදනයේ වෙනස්කම්වල ප්‍රතිපල වශයෙන් දැඩි පීඩනයකට හසුවනු ඇත. "ලෝකය පුරාම වෙරලාශ්‍රිත ජනාවාස ජලයෙන් යටවීම, විශේෂයෙන්ම, නෙදර්ලන්තය, එක්සත් ජනපදය, දකුනු ආසියාව හා චීනය, ප්‍රාදේශීය හා ජාතික අනන්‍යතාවන්ට පවා අභියෝග කිරීමේ ශක්‍යතාවය ගැබ්කර ගනියි. නයිල් හා එහි අතු ගංගා ආශ්‍රිතව මෙන්, සම්පත් මුල්කොටගෙන ජාතීන් අතර අවි ගැටුම් ඇතිවීමේ හැකියාව හා න්‍යෂ්ටික යුද්ධයක හැකියාව පවා ඉවත දැමිය නොහැකිය. මෙම වාතාවරනය හමුවේ දේශගුනික විපර්යාස, මනුෂ්‍ය වර්ගයා හා ස්වභාවධර්මය අතර සම්බන්ධතාවයේ ස්ථාවර වෙනසක් නිර්මානය කරනු ඇත."

වසර 2100 වන විට ගෝලීය සාමාන්‍ය උෂ්නත්වය සෙල්සියස් අංශක 5.6 න් ඉහල ගිය විට ඇතිවියහැකි ව්‍යසනකාරී වාතාවරනය තුල ලෝකය දැකිය හැකි වන්නේ මැඩ් මැක්ස් චිත්‍රපටියෙහි නිරූපනය කර තිබූ ආකාරයට ය. "වෙරල තීරු නොමැති, දැඩි උනුසුමක් සහිත හා තව තවත් ව්‍යසනයන්ගෙන් පිරුනු" තත්වයකි. "ආන්තික දේශගුනික වෙනස්වීම් හා අත්වැල් බැඳගත් බිඳවැටීම් හා ව්‍යසනයන්, නූතන ජීවිතයේ සෑම අංශයක්ම මුලුමනින්ම පාහේ අස්ථාවර කරනු ඇත." අධ්‍යයනයට අනුව සැසඳිය හැකි එකම දසුන වනුයේ එක්සත් ජනපද-සෝවියට් න්‍යෂ්ටික යුද්ධයකින් ඇතිවිය හැකි තත්වය පමනි.

බරපතල ලෙසත් වේගයෙනුත් නරක අතට හැරෙන දේශගුනික විපර්යාස තත්වය හා, කෝපන්හේගන් දේශගුනික වෙනස්වීම් පිලිබඳ සමුලුවේ ඊනියා "ලෝක නායකයන්ගේ" ගනන්බැලීම් අතරත්, අති මූලික වෙනසක් පවතියි. සමුලුවෙහි මේ සියලු ඇඹරීම්, හැරීම් හා උපාමාරු සැලකිල්ලට ගැනීම සඳහා මෙහි අපට ලැබී ඇති කාලයට වඩා බෙහෙවින් දීර්ග කාලයක් ගතකල යුතුය. එහෙත් මූලික ප්‍රශ්න පැහැදිලිය. සමුලුව දේශගුනික විපර්යාස සමග පොරබැදීම සඳහා නම් නොවේ. එය වනාහි, හොඳම ප්‍රතිපලය තමන්වෙත හිමිකර ගනිමින්, ගැටලුව තමන්ගේ ප්‍රතිමල්ලවයන් වෙත තල්ලු කල හැකි කොන්දේසි නිර්මානය කර ගැනීම සඳහා ප්‍රධාන බලවතුන් පොර වැදීසිටින සමුලුවකි.

ඉන්ඩිපෙන්ඩන්ට් නම් බ්‍රිතාන්‍ය පුවත් පතෙහි දෙසැම්බර් 11 සංස්කරනයේ ජොහාන් හාරි විසින් පලකල වාර්තාවක, මෙම සිදුවීම කැටිකොට දැක්වූයේ මෙසේය. "කෝපන් හේගන් සමුලුව වෙත පැමිනි සෑම නියෝජිතයෙකුම පිලිගනු ලැබුවේ, නගරයේ මධ්‍යම චතුරස්‍රය අරා සිටි දැවැන්ත කෘතීම ලෝක ගෝලයක දර්ශනයකිනි. කරකැවෙන මෙම ගෝලය වැසී තිබුනේ ව්‍යාපාර වෙලඳ ලාංඡන වලිනි. කෝක් (කොකාකෝලා) ලාංඡනය අප්‍රිකාව මත පිහිටුවා තිබුනු අතර, කාල්ස්බර්ග් (බීර) ආසියාව හිමිකරගෙන ඇති සෙයක් පෙනුනි. ඉහලින් ලෙලදෙන දැවැන්ත රතු අකුරු වලින් "මා එයට ආදරය කරමි!" යනුවෙන් මැක්ඩොනල්ඩ්ස් නිවේදනය කලේ ය. "කෝපන්හේගන් ඔබ සාදරයෙන් පිලිගනියි!" යනුවෙන් එය හඬ නැගීය. එය අහසේ රඳවා තිබුනේ එක දිගට නිකුත් කල උනුසුම් වායු දහරා මඟිනි. මෙම ප්ලාස්ටික් පෘතුවි ග්‍රහයා සමුලුව සඳහා නියම සංකේතයක් විය. ලෝකයට කියා තිබුනේ මෙය දේශගුනික අර්බුදය විසඳීමේ හදිසි සමුලුවක් බවය. එහෙත් අපගේ නායකයන් රැස්වන මෙම බෙලා මධ්‍යස්ථානයේ අභ්‍යන්තරයෙහි ඔබට දැකගත හැක්කේ, ජෛව ගෝලය අවුල්වීමේ ගැටලුව නිරාකරනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන අවම කොන්දේසි වලින් පැනයාමට රටවල් වලට ඉඩ සැලසෙන පරිදි සැලසුම් කල, දූෂිත ලෙස සිදුවන වචන හුවමාරුවක් පමනි."

මෙම දූෂිත ක්‍රියාවලිය පිලිබඳ හොඳම නිදසුනක්, විශාල කෘෂිකාර්මික ප්‍රදේශ සහිත ඕස්ට්‍රේලියාව හා අනෙකුත් රටවල්, විශේෂයෙන්ම, එක්සත් ජනපදය හා කැනඩාව, පස තුලට වඩ වඩාත් කාබන් උරාගැනීමෙන් සිදුවන හානියට ඔවුන්ගේ කාබන් විමෝචනය "හිලව් කල" හැකිවන පරිදි ගිවිසුමක් ඇතිකර ගැනීමට රඩ්ගේ ලේබර් ආන්ඩුව දරන ලද උත්සාහය මගින් පිලිඹිබු කෙරුනි. සිඩ්නි මෝනිං හෙරල්ඩ් වාර්තාවක සඳහන්වූ පරිදි, මෙම රටවලට හෙක්ටෙයාර මිලියන සිය ගනනක භූමි ප්‍රදේශ අයත්ව තිබීම නිසා "පසෙහි කාබන් ප්‍රතිශතයේ ඉතා සුලු ඉහල යාමකින් එම රටවල ශුද්ධ විමෝචනයේ දැවැන්ත පහත වැටීමක් ඇතිකල හැකිය." 1990 සිට ඕස්ට්‍රේලියාවේ හරිතාගාර වායු නිකුතුව සියයට 82 න් ඉහල නැඟී ඇති බවට මෑතම සංඛ්‍යා මගින් පෙන්නුම් කර ඇති තත්වය හමුවේ මෙය එරටට සුවිශේෂ වැදගත්කමක් දරයි. මේවා සහ අනෙකුත් වාර්තා සැලකිල්ලට ගත් කල්හි, හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් නමැති සුරංගනා කථා රචකයාගේ උපන් බිම වන කෝපන්හේගන්,

සමුලුව සඳහා ඉතාමත් යෝග්‍ය ස්ථානය ලෙස යම් අහඹුවකින් තීරනය වූවා දෝ යන සැකය යමෙකුට ඇතිවිය හැකිය.

කෝපන්හේගන්හි දිගහැරුනු ප්‍රහසනය නිරීක්ෂනය කිරීමේදී පහත සඳහන් ප්‍රශ්නය මතුවෙයි. තමන්ගේම උපදේශකයන්ගේ මේ සියලු අනතුරු ඇඟවීම් හා සාක්ෂි හමුවේ, මෙම අර්බුදයට සාධනීය ලෙස ප්‍රතිචාර දැක්වීම කෙරෙහි ආන්ඩුවලින් දරදඬු ලෙස පලවූ මෙම අකැමැත්ත, තනි තනි තන්ත්‍රයන්, පුද්ගලයන්, නායකයන් යනාදීන්ගේ අභිමතයක් ද නැතහොත්, වර්තමාන ආර්ථික හා දේශපාලන පර්යාය තුලම, එනම්, පවත්නා ආකෘතිය තුල විසඳුමක් සම්පාදනය කල නොහැකි එම ව්‍යුහය තුලම, නිශ්චිතව මුල්බැස ඇත්තේ ද යන ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නවලට යමෙක් පිලිතුරු දෙන්නේ කෙසේ ද යන්නෙන්, එකිනෙකට මුලුමනින් වෙනස්වූ පර්යාලෝකයන් ගලාඑයි.

කෝපන්හේගන් සමුලුව ප්‍රෝඩාවක් බව ජොහාන් හාරි පැහැදිලිව ම හඳුනා ගත්තේය. ඔහු "වංචනික" යන යෙදුම භාවිතා කලේය. එහෙත් අනෙක් අතට ඔහු දරනු ලැබුවේ, විසඳුම් සොයන ලෙසට බලපෑම් කිරීමේ ව්‍යාපාරය ඇති තරම් ලොකු නම්, එහි හඬ ඇති තරම් බලවත් නම් හා දේශපාලන උනුසුම සැහෙන තරම් නංවන්නේ නම්, සැබෑ හා ඉක්මන් පහත හෙලීමක් ප්‍රතික්ෂේප කරන කුමන ජාතියකට හෝ එරෙහිව පියවර ගන්නා, ගෝලීය පරිසර අධිකරනයක් පිහිටුවීමෙන් භෞතික උෂ්නත්වය පහත හෙලීම සඳහා ශක්‍ය යාන්ත්‍රනයක් ගොඩනැඟිය හැකිය යන අදහසයි. ඕනෑවට වඩා හඬනැගීමේ අවදානම සහිතව වුවත් විවිධ ධනේශ්වර ආන්ඩුවලට, වැඩට බසින ලෙසට බලපෑම් කිරීමේ අරමුන සහිත එවන් පර්යාලෝකයක් සුරංගනා කථාවකි. ඒ මන් ද යන්න පැහැදිලි කිරීම සඳහා අපි ගෝලීය ධනේශ්වර පද්ධතියේ මූලික ව්‍යුහයන් සමාලෝචනය කරමු.

## දේශගුනික විපර්යාස හා ගෝලීය ධනවාදයේ ප්‍රතිවිරෝධතා

අප දේශගුනික විපර්යාස පිලිබඳව සැලකිලිමත් වීමට පටන් ගන්නා විටම, කරුනු දෙකක් දෘෂ්‍යමාන වෙයි. පලමුවැන්න නම් එහි ස්වභාවයෙන්ම, ගැටලුව විසඳිය හැක්කේ ජාතිකව නොව ගෝලීයවය යන්නයි. දෙවැන්න නම්, ආර්ථික හා සමාජ ජීවිතයේ සංවර්ධනය ලෙස සැලකෙන මිනිසාගේ නිෂ්පාදන ක්‍රියාවලිය, ස්වභාව ධර්මය සමග මානව වර්ගයාගේ සම්බන්ධතාවෙන් පිටත තබා සැලකිය නොහැකි වීමයි. එය වෙනත් ලෙසකින් කිවහොත්, ස්වභාවධර්මයේ ම කොටසක් හා නිමැවුමක් වන මානව ක්‍රියාකාරකම් හා, මානව වර්ගයා රඳාපවත්නාවූ අවශේෂ ස්වභාවධර්මය අතර බෙදුම්කඩනයක් නොපවතින බවයි. මානව වර්ගයාගේ නිෂ්පාදන ක්‍රියාකාරකම් පවත්වාගත යුත්තේ ස්වභාවධර්මයේ නියාමයන්ට අනුකූලව මිස ඉන් ස්වාධීනව නොවේ. කෙසේ වෙතත්, මේ ප්‍රශ්න සැලකිල්ලට ගන්නා විට අපට එක පැහැර අභිමුඛ වන්නේ, ගෝලීය ධනේශ්වර පර්යායේ එම පදනම් මය.

ජාතික රාජ්‍ය පද්ධතිය පිලිබඳ ප්‍රශ්නය සලකා බලන්න. මාක්ස්වාදය දිගු කලකට පෙරම, ධනවාදය යටතේ ගෝලීය ආර්ථිකයේ සංවර්ධනය හා ලෝකය එකිනෙකට ගැටෙන ජාතික රාජ්‍ය ලෙස බෙදී තිබීම අතර ප්‍රතිසතිතාව පෙන්වා දුන්නේය. එම ප්‍රතිවිරෝධය වසර 100 ක් තරම් ඈත දී පලමු ලෝක සංග්‍රාමය ලෙස පුපුරා ගියේය. පූර්ව දශක හතර පුරා ලෝක ආර්ථිකයේ සිදුවූ ප්‍රසාරනය, ප්‍රධාන ධනේශ්වර බලවතුන් අතර වෙලඳපොලවල්, ලාභ හා සම්පත් සඳහා ගැටුමකට දොර විවර කලේය.

ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ එම ප්‍රතිවිරෝධයම යලිත් හිස ඔසවා තිබේ. වසරකට පෙර පුපුරා ගිය අර්බුදය කෙරේ ධනේශ්වර බලවතුන්ගේ ප්‍රතිචාරය වූයේ අන් සියල්ලට ඉහලින් තමන්ගේ ම ආර්ථිකය හා මූල්‍ය පද්ධතිය රැකගැනීම සඳහා පියවර ගැනීමයි. සෑම මහා බලවතෙකුම දේශගුනික විපර්යාසයේ පිරිවැය තම ප්‍රතිමල්ලවයන්ගේ කර මතට හෙලීමටත්, පිහිටුවාගත හැකි කුමන හෝ විමෝචන හුවමාරු පද්ධතියකින් උපරිම ප්‍රතිලාභ ලැබීමටත්, තම වියදම් අවම කර ගැනීමටත් වෙර දරන අතරතුර, එය යලි වතාවක් දැන් කෝපන්හේගන් සමුලුව තුල හිස ඔසවා තිබේ.

ඇමරිකානු අර්ථශාස්ත්‍රඥ ජෙෆ්රි සැක්ස් සිය *Commonwealth, Economics for a Crowded Planet,* (පොදුරාජ්‍යමන්ඩලය, ජනයාගෙන් පිරි ග්‍රහලෝකයේ අර්ථශාස්ත්‍රය) නමැති කෘතිය තුලදී ශිෂ්ඨාචාරයේ උන්නතිය සඳහා මෙම ගැටලුවේ ඇති වැදගත්කම පෙන්වා දුන්නේය. ඔහු මෙසේ ලිවීය. "21 වන සියවස අර්ථවත් කරන අභියෝගය වනු ඇත්තේ, ජනාකීර්න ග්‍රහ ලෝකය මත මානව වර්ගයා පොදු ඉරනමක් හිමිකරගෙන සිටින්නේය යන යථාර්තයට මුහුන දීමයි. එම පොදු ඉරනම නව වර්ගයක ගෝලීය සහයෝගීතාවක් ඉල්ලා සිටියි. බොහෝ ලෝක නායකයන් තවමත් අවබෝධ කරගෙන නැති හෝ තවමත් වැලඳගෙන සිටින අන්ධ උදාසීනත්වය මූලික කාරනය බවට පත්ව තිබේ. 21 වන සියවස තුල අපගේ ගෝලීය සමාජය එක්කෝ වැජඹෙනු ඇත නැතහොත් වැනසෙනු ඇත. එසේ වන්නේ, එකිනෙකා පංගුකරුවන් වන අරමුනු කට්ටලයක් හා ඒවා සාක්ෂාත් කර ගැනීමේ ප්‍රායෝගික මාධ්‍යයන් මත ලෝකය පුරා පොදු පසුබිමක් සොයාගැනීමේ ලා අපට ඇති හැකියාවට අනුකූලවය."

ඉන්ධන සම්පත් හිගය, ආර්ථික අසමානතාවය හා පාරිසරික ගැටලු මගින් දහනය කෙරෙන නැගීඑන ආතතීන් හේතුකොටගෙන "ශිෂ්ඨාචාරයන්ගේ ගැටුම" වර්ධනය විය හැකි බවට සැක්ස් අනතුරු අඟවයි. එය "අපගේ අවසාන හා පරම වශයෙන්ම විනාශකාරී ගැටුම විය හැකිය. ඒකාබද්ධ ගෝලීය ආර්ථිකය හා බෙදීගිය ගෝලීය සමාජය පිලිබඳ පරස්වාචකයක්, පෘතුවි ගෝලයේ එකම මහා තර්ජනය මතු කරයි. මක්නිසා ද යත්, එය ඉතිරිව ඇති අභියෝග ජයගැනීමට අවශ්‍ය සහයෝගය ගොනු නොකල හැකි තත්වයක් නිර්මානය කරන බැවිනි. අප එකකින් ගැලවී ගත්තත්, ශිෂ්ඨාචාරයන්ගේ ගැටුම, මානව වර්ගයා මෙතෙක් කලක් ගොඩනැගූ සියල්ල ඔවුන්ට අහිමි කරන අතර ඉදිරි පරම්පරා ගනනාවක් මත අඳුරු සෙවනැල්ලක් පතිත කරනු ඇත." සැක්ස්, මාක්ස්වාදයේ ඉතා සාවධාන විරුද්ධවාදියෙකු වුවත්, මාක්ස්වාදීන් හඳුනාගෙන ඇති ලෝක ධනේශ්වර පද්ධතියේ අති මූලික ප්‍රතිවිරෝධය, මානව වර්ගයාගේ පැවැත්මට ම තර්ජනය කරන බව පිලිගැනීමට ඔහුට බලකෙරී ඇත.

එහෙත්, ගැටලුව පෙන්වාදීමෙන් අනතුරුව ඔහු යෝජනා කරන්නේ කුමන විසඳුමක් ද? හුදෙක් නව ජෝන් එෆ් කෙනඩි කෙනෙක් ඉස්මතුවී, 1963 දී න්‍යෂ්ටික අත්හදාබැලීම් තහනම් කිරීමේ ගිවිසුම සමග ඇතිකර ගත් ආකාරයේ ජාත්‍යන්තර සහයෝගිතාවේ යුගයක්, අරඹනු ඇතැයි යන අවිනිශ්චිත බලාපොරොත්තුවක් පමනක් ඇත. ගෝලීය සහයෝගිතාවය දැල්විය හැකි යම් ශ්‍රේෂ්ඨ නායකයෙකු මවාපෑමේ උත්සාහයන් - සැක්ස් 2008 වසරේදී සිය ග්‍රන්ථය රචනා කරන විට පැහැදිලිව ම ඔහුගේ සිතේ ඇඳී තිබුනේ ඔබාමාය - සරලව ම නොතකා හරින්නේ, ජාතික රාජ්‍ය පද්ධතිය යනු හුදෙක් ගසාදැමිය හැකි යම් ආකාරයක නයි හැවක් නොවන්නේය යන කාරනයයි. එය, ධනේශ්වර දේශපාලන ආර්ථිකය සඳහා ව්‍යූහාත්මක පදනම සම්පාදනය කරයි.

කෝපන්හේගන්හි මුලුදුන් ඊනියා "ලෝක නායකයින්" නියෝජනය කරන්නේ "ඔවුන්ගේම" ජාතික රාජ්‍යයන්ගේ අවශ්‍යතාවන් හා එම රාජ්‍යයන් සේවය සලසන ධනේශ්වර පන්තීන්ගේ අවශ්‍යතාවන්ය. එම ආසක්තයන් අනෙකුත් ධනේශ්වර මහා බලවතුන් සමඟ ප්‍රතිවිරෝධී වන අතර ගැටුමකට තුඩුදෙයි. ඔබාමා නොබෙල් සාම ත්‍යාගය පිලිගනිමින් අවධාරනය කල පරිදි, ඔහු නියෝජනය කරන්නේ ඇමරිකානු ජාතික රාජ්‍යය වන අතර එහි අවශ්‍යතා මත ක්‍රියා කරයි. ගෝලීය මානව වර්ගයාගේ නව අවශ්‍යතා ඉටුකරනු වස්, ජාතික රාජ්‍ය පද්ධතිය තව දුරටත් යලි හැඩගැස්වීම හෝ පිලිසකර කිරීම, ධනවාදය මතුවී ඒමත් සමඟ ඇතිවූ නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය දරාගත හැකිවන පරිදි වැඩවසම් රාජ්‍ය පද්ධතිය යොදාගත නොහැකිවූවාක් සේම, කල නොහැකිය. ධනේශ්වරය විසින් වැඩවසම් රාජ්‍ය පද්ධතිය පෙරලා දැමිය යුතුව තිබුනි. මානව වර්ගයාට තමන් මුහුනපා සිටින ගැටලු ජයගත හැකිවන පරිදි හා තම ඓතිහාසික ප්‍රගමනය සාක්ෂාත්කර ගත හැකිවන පරිදි ගෝලීය කම්කරු පන්තිය විසින් දැන්, ධනේශ්වර ජාතික රාජ්‍ය පද්ධතිය පෙරලා දැමිය යුතුය.

ජාතික රාජ්‍ය විසින් ඇතිකල ගැටලු පවතින්නේ වී නමුත්, පොදු ශුභසිද්ධිය වෙනුවෙන් ක්‍රියාකරන ලෙස විවිධ ජාතීන්ට බලකල හැකි යම් ආකාරයක ගෝලීය වෙලඳපොල යාන්ත්‍රනයක් පිහිටුවීම තුලින් ඒවා ජයගත නොහැකි ද? වෙලඳපොල තුලින් අපට ධනවාදය "කොලපැහැ ගැන්විය" හැකියයි ඔවුහු තර්ක කරති. එබැවින් සමාජවාදීන් විසින් ඉදිරිපත් කරන පෙරලිකාරී විසඳුම් අවශ්‍ය නොවේ. අපි මෙම ප්‍රකාශ සලකා බලමු.

දේශගුනික විපර්යාස පිලිබඳ 2006 සිය වාර්තාව තුල හිටපු ලෝක බැංකු අර්ථශාස්ත්‍රඥ නිකොලස් ස්ටර්න්, ගෝලීය උනුසුම්වීම හා ඉන් මතුවන අන්තරායන්, ඉතිහාසයේ දැවැන්තම වෙලඳපොල අසාර්ථකත්වයේ ප්‍රතිපලය බව පිලිගත්තේය. එහෙත් ලෝකය වටා ආන්ඩු හා ඒවායේ විශේෂඥ කමිටු විසින් ඒවාට "විසඳුම්" ලෙස නිර්දේශ කලේ එම ගැටලු නිර්මානය කරනු ලැබූ එම වෙලඳපොලම ඒ සඳහා යොදාගන්නා ලෙසය. නිශ්චිත ප්‍රශ්නය කිසිවෙකුත් මතු කලේ නැත. එනම්, මෙම ව්‍යසනය ගෙන ආවේ වෙලඳපොල විසින් නම්, එය සතුව ඇති අනෙකුත් විනාශකාරී දේ කවරේ ද යන්නයි. ඊනියා විශේෂඥයෝ නිහඬ වූහ. එහෙත් වෙලඳපොල පැහැදිලිව හා ශබ්ද නඟා කථා කලේය. ස්ටර්න්ගේ වාර්තාවෙන් වසරකට මඳක් වැඩි කාලයක ඇවෑමෙන්, සියවස් තුන්කාලකින් මෙපිට ඇතිවූ දැවැන්තම මූල්‍ය බිඳවැටීමට ගෝලීය මූල්‍ය පද්ධතියේ වෙලඳපොල යාන්ත්‍රනය විසින් දොර විවර කලේය. එය සලකුනු කලේ, ලෝකය පුරා බිලියන ගනන් මිනිසුන් දැන් ජීවත් වන්නේ හා වැඩ කරන්නේ කිසිදු අනතුරු ඇඟවීමකින් තොරව තමන් දුගීභාවයට ඇද දැමීමට තර්ජනය කරන හා තමන්ට කිසිදු පාලනයක් නොමැති ආර්ථික පද්ධතියක් තුලය යන්නයි. අපට දැක ගත හැකි පරිදි, ගෝලීය මූල්‍ය අර්බුදයට ද ඇත්තේ පෘතුවි ගෝලය උනුසුම්වීමේ අර්බුදයට ඇති එම ව්‍යුහය ම ය. වත්මන් සමාජ-ආර්ථික පර්යාය යටතේ කෙසේ වත් තමන්ට පාලනයක් නොමැති, තමන්ගේම ආර්ථික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිපලය මඟින්, මානව වර්ගයා තර්ජනයට ලක්ව තිබේ.

## මාක්ස් හා ස්වභාවධර්මය සමඟ මිනිසාට ඇති සම්බන්ධය

ඊනියා "හරිත" දේශපාලන ප්‍රවනතාවන්ගේ විවිධ නියෝජිතයන් විසින් නිරතුව ම පාහේ ඉදිරිපත් කරන තර්කයක් වන්නේ, ධනේශ්වර පද්ධතියෙහි ගාමක

බලය බවට පත්වන ලාභය සඳහා වන තල්ලුවත්, නිෂ්පාදන මාධ්‍යයන්ගේ පුද්ගලික අයිතිය මත පදනම්ව ඇති මෙම පද්ධතියේ ක්‍රියාකාරිත්වයත් අතර ඇති පැහැදිලි සම්බන්ධතාව තිබියදී ම, දේශගුනික විපර්යාස පිලිබඳ ගැටලුවට මාක්ස්වාදය සතුව පිලිතුරක් නොමැතිය යන්නයි. මක්නිසා ද යත් එය, ගැටලුවේ මූලාශ්‍රය වන නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනය සමඟ බැඳී ඇති නිසාය. එවන් තර්ක නිශ්චිත දේශපාලන අරමුනු වෙනුවෙන් සේවය කරයි. ඒවායේ අරමුන වන්නේ, ධනේශ්වර ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිලිබඳව ප්‍රශ්න කිරීමට පටන් ගන්නා සියලු දෙනා, විශේෂයෙන්ම තරුන කොටස්, සමාජවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීමේ කර්තව්‍යයෙන් ඉවතට හරවා, ධනේශ්වරය හා එහි පක්ෂවල අත යටට දැක්කීම හෝ පුද්ගලවාදී විසඳුම් සෙවීමේ තැනට යොමු කිරීමයි. මෙම දෙවනුවට කිවූ වර්ගය පිලිබඳ නිදසුනක්, ශූන්‍යයේ අගය යන හිසින් රාජ් පටෙල් විසින් මෑතකදී පල කල ග්‍රන්ථයකින් සොයාගත හැකිය. ගත් කතුවරියක් වන නයෝමි ක්ලේන් විසින් උද්දාමයෙන් යුතුව සඳහන් කරන්නේ එම කෘතිය වෙලඳපොල සමාජය පිලිබඳ "ප්‍රති තුලනයක්" සඳහා කැඳවුම් කරන බවයි. එවන් අරමුනක් සාක්ෂාත්කර ගන්නේ කෙසේ ද? පටෙල්ට අනුව සැබවින්ම ගැටලුව පවත්නේ අප තුලම ය. "අපගේ හදවත් තුලින් ආශාව උපුටා දැමීම" කෙරෙහි අපගේ අවධානය යොමුවිය යුතුය. එය කල යුත්තේ "වටිනාකම පිලිබඳ බෞද්ධ න්‍යාය" මත පදනම් වෙමින් මධ්‍යම ප්‍රතිපදාවක් වර්ධනය කිරීම මගිනි. එක්තරා වර්ගයක ජීවන රටාවක් පිලිබඳ ලබ්ධියක් වෙනුවෙන් අනුශාසනා කරන බවක් පෙන්නුම් කිරීමට පටෙල් කැමැත්තක් නොදක්වන බැවින් ඔහු, පුලුල් ලෝකයේ වෙනස්කම් තුලට බෞද්ධ ධර්මයෙන් අන්තර් දෘෂ්ටියක් සම්පාදනය කරන බව කියා සිටියි. පටෙල්ට අනුව, දලයි ලාමා, තෙමේ අගය කරන ආර්ථික ක්‍රමය පිලිබඳ ආස්ථානයක් දරන අතර, තෙමේ "මාක්ස්වාදී හිමිනමක්" හා "බෞද්ධ මාක්ස්වාදියෙක්" ලෙස හඳුන්වා ගනියි. මා මෙම නිදසුන ගෙනහැර දැක්වූයේ, ධනවාදයට එරෙහි දේශපාලන හා සමාජ අරගලය ප්‍රතික්ෂේප කිරීම අනිවාර්යයෙන්ම ගමන්කල යුත්තේ කොතැනට දැයි පැහැදිලි කිරීමටය. එය, අර්බුදය වෙනුවෙන් අපගේම "ආශාවන්" මත දෝෂය පටවන අතර ගුය්වාදය හා ආගම කරා පල්ලම් බැසීමකි.

මාක්ස්ගේ වැඩ කටයුතු පිරික්සීමේ දී පෙනී යන්නේ, "හරිතයන්" හා ඔවුන්ගේ න්‍යායාචාර්යවරුන් ප්‍රකාශ කරන ආකාරයට මාක්ස්වාදය යල්පැන තිබීම නොව, අර්බුදය සමඟ පොරබැදීම හා විසඳීම කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨ විප්ලවවාදීන් විසින් සම්පාදනය කර තිබෙන මූලික ක්‍රමවේදී ආකෘතිය හා විශ්ලේෂනය නොමැතිව එය අවබෝධකර ගැනීම පවා කල නොහැකිය යන්නයි. නියත වශයෙන්ම මාක්ස්, දේශගුනික විපර්යාස පිලිබඳ ගැටලුව සමඟ කෙලින්ම පොරබදා නැත. එහෙත් ඔහු, මෙම අර්බුදය පැනනැඟීමට තුඩුදුන් ධනවාදයේ සමාජ සම්බන්ධතා හා ස්වභාවධර්මය සමඟ මිනිසාගේ සම්බන්ධතාවය මත ඒවායේ බලපෑම හෙලිදරව් කිරීමේ අරගලයක නිරත විය.

*කැපිටාල්හි* (ප්‍රාග්ධනය) 1 වන වෙලුමේ 7 පරිච්ඡේදය ආරම්භයේ දී මාක්ස්, ශ්‍රම ක්‍රියාවලිය පිලිබඳ වැදගත් විශ්ලේෂනයක් සපයා ඇත. "සියල්ලට ම පලමුව ශ්‍රමය වනාහි, මිනිසා හා ස්වභාවධර්මය අතර ක්‍රියාවලියකි, එහිදී මිනිසා, තමා හා ස්වභාවධර්මය අතර පරිවෘත්තිය, තමන්ගේම ක්‍රියාකාරකම්, මැදිහත් වීම, නියාමනය හා පාලනය මගින්, හසුරුවනු ලබයි. ඔහු ස්වභාවධර්මයේ බලවේගයක් ලෙස ස්වභාවධර්මයේ ද්‍රව්‍යයන් සමඟ පොරබදයි." මාක්ස් පැහැදිලි කල පරිදි ශ්‍රමය, ස්වභාවධර්මයෙන් අනවන ලද අවශ්‍යතාවකි. ප්‍රශ්නය, මිනිසා නිෂ්පාදන ක්‍රියාවලිය තුල ශ්‍රමය යොදවන්නේ ද යන්න නොවේ. අවශ්‍යතාවය මත ඔහු එසේ කල යුතුය. ප්‍රශ්නය වන්නේ එම ක්‍රියාවලිය සිදුවන්නේ කෙසේ ද යන්නයි. මිනිසා "තමා හා ස්වභාවධර්මය අතර පරිවෘත්තිය පාලනය කරන්නේ" ශ්‍රමය තුලින්ය. "පරිවෘත්තිය" පිලිබඳ සංකල්පයට මූලික වන්නේ, ජීවිතයට හා වර්ධනයට ඉඩ සැලසෙන පරිදි, අන්තර් ක්‍රියාකාරිත්වයේ සම්පූර්න කට්ටලයක් ක්‍රියාත්මක වන පදනමය යන අදහසයි.

මාක්ස් ලිවූ කාලයේ දේශගුනික විපර්යාසයේ ගැටලුව මතුවී නොතිබුනු අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුල ප්‍රධාන ගැටලු පැන නංවමින් ස්වාභාවික පරිසරය මත ධනවාදය විසින් ඇතිකරන බලපෑම පෙනෙන්නට තිබුනි. මේ ගැටලු අද දින දක්වාම ඉතිරිව තිබේ.

ධනවාදයේ සමාජ සම්බන්ධතා පදනම්ව ඇත්තේ, අවසාන විග්‍රහයේදී, වෙලඳපොල තුල ශ්‍රම ශක්තිය නැතිනම් වැඩකිරීමේ ධාරිතාවය මිලට ගැනීම හා විකිනීම මතය. ධනවාදයට බොහෝ කාලයකට පෙර සිටම වෙලඳපොලවල් පැවතුනි. කෙසේ වෙතත් ඓතිහාසිකව ගත්කල, ශ්‍රම ශක්තිය වෙලඳපොලට පැමින, වැටුප් ශ්‍රමයේ පදනම මත නිෂ්පාදනය ආරම්භ කරන තෙක්, වෙලඳපොල හා වෙලඳ භාන්ඩ නිෂ්පාදනය, ආර්ථික සංවිධානයේ අධිකාරවත් ආකෘතිය බවට පත්ව නොතිබුනි.

මෙම සමාජ ක්‍රමය නැගී ආවේ කෙසේ ද? වැටුප් ශ්‍රමය මතුවුනේ කෙසේ ද? පැහැදිලිවම මේවා ස්වභාවධර්මයේ නොව ඓතිහාසික සංවර්ධනයේ නිමැවුම් විය. වැටුප් ශ්‍රමය මතුවී ආවේ, සරල නිෂ්පාදකයන් නිෂ්පාදන මාධ්‍යයන්ගෙන්, සියල්ලටමත් පලමුව ඉඩම් වලින් හා ස්වභාවධර්මයෙන්, වෙන්කර දැමූ පසුව හා ඔවුන්ගේ ශ්‍රම ශක්තිය, නිෂ්පාදන බලවේග හා ඉඩම් අයිතිකරුවන්ට විකිනීම මගින් හැරෙන්නට ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමේ අන් මගක්

නොමැතිවූ කල ය. පරිවෘත්තිමය විභේදනයක් ලෙස සැලකෙන මිනිසා හා ස්වභාවධර්මය එකිනෙකින් මෙසේ වෙන්කිරීම, දේශගුනික විපර්යාස පිලිබඳ අර්බුදයේ මූලය ලෙස පවතියි.

මෙම පරිවෘත්තිමය විභේදනය ආරම්භයේදී පෙනෙන්නට පටන්ගත්තේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුලය. *කැපිටාල්හි* (ප්‍රාග්ධනය) 1 වෙලුමේ 15 පරිච්ඡෙදෙය අවසානයේ මාක්ස් මෙසේ ලිවීය. "ධනේශ්වර නිෂ්පාදනය විසින් ජනගහනය විශාල මධ්‍යස්ථාන තුලට ඒකරාශි කලේය. මෙයින් නාගරික ජනගහනයට වඩ වඩාත් ඉහල නගින සනත්වයකට මුහුනපෑමට සිදුවිය. මෙයින් ප්‍රතිපල දෙකක් ඇතිවිය. එක් අතකින් එය සමාජයේ ඓතිහාසික අභිප්‍රායාත්මක ශක්තිය සංකේන්ද්‍රනය කලේය. එනෙක් අතට එය මිනිසා හා මිහිතලය අතර පැවති පරිවෘත්තිමය අන්තර් ක්‍රියාකාරිත්වයට බාධා පැමිනවිය. එනම්, ආහාර හා ඇඳුම් පැලඳුම්වල රූපයෙන් මිනිසා විසින් පාරිභෝජනය කල දෙයෙහි සංයෝගී මූලද්‍රව්‍ය පසට යලිත් එකතුවීම වැලැක්වීය. එබැවින් එය පසෙහි කල්පවතින සාරවත් භාවය සඳහා අවශ්‍ය සදාතනික ස්වාභාවික කොන්දේසි ක්‍රියාත්මක වීම අවහිර කලේය. ඒ අනුව එය ඒ සමග ම, නාගරික කම්කරුවාගේ ශරීර සෞඛ්‍ය හා ග්‍රාමීය කම්කරුවාගේ බුද්ධිමත් ජීවිතය ද විනාශ කලේය." (1) මහා නාගරිකයන්හි අපද්‍රව්‍ය භූමියට යලි එකතු නොකොට විසුරුවා හරින ලදී. මෙය තුඩු දුන්නේ, වෙනත් මාර්ග වලින් යලි ගොඩනැගීමට සිදුවූ, පසේ සාරවත්භාවය ක්ෂය වී යාමටයි. අද දින නයිට්‍රජන් සහිත පොහොර නිෂ්පාදනය හරහා ගෙනයන ක්‍රියාවලියෙන් ජල හිඟයේ රූපය ගත් නව ගැටලු කට්ටලයක් නිර්මානය වී තිබේ.

කාබන් ඩයොක්සයිඩ් හා වෙනත් හරිතාගාර වායු, යලි උරාගැනීමට නොහැකි තරමේ වේග අනුපාතයකින් වායුගෝලයට නිකුත් කිරීමේ ප්‍රතිපල වශයෙන් ඇතිව තිබෙන ගෝලීය උනුසුම්වීම, ධනේශ්වර කෘෂිකර්මයට සම්බන්ධිතව මාක්ස් විසින් පැහැදිලි කල ක්‍රියාවලීන් තව දුරටත් වර්ධනය වීමකි. විසඳුම කුමක් ද? මාක්ස් එය මෙසේ පෙන්නුම් කලේය. ධනේශ්වර නිෂ්පාදන මාදිලිය විසින් අසංවර්ධිත හා ලදරු අවස්ථාවක පැවති කෘෂිකර්මය හා කර්මාන්තය යන දෙක එකට බැඳ තැබූ ප්‍රාථමික පවුල් සම්බන්ධතාව බිඳ විසුරුවා හැරීම සම්පූර්න කලේය. එහෙත් ඒ සමඟම එය, කෘෂිකර්මය හා කර්මාන්තය එහි විසංවාදී හුදෙකලා අවධිය තුල වර්ධනය කර තිබෙන ආකෘතීන්ගේ පදනම මත, නව හා ඉහල සංකලනයක් සඳහා ද්‍රව්‍යමය කොන්දේසි නිර්මානය කලේය. (2) අර්බුදයට විසඳුම රැඳී ඇත්තේ කවරාකාරයෙන් හෝ කල නොහැකි පරිදි, අතීතය කරා පල්ලම් බැසීම තුල නොව, ඉහල සමාජ හා ආර්ථික පර්යායක් ගොඩනැගීම තුලය.

එවන් සංකලනයක් සාක්ෂාත් කල හැක්කේ, නිෂ්පාදන මාධ්‍යයන්ගේ පුද්ගලික අයිතිය හා ජාතික රාජ්‍ය පද්ධතිය මත පදනම්ව ඇති ධනේශ්වර දේපල සම්බන්ධතා පෙරලා දැමීම හා නිෂ්පාදන බලවේග සමස්තයක් ලෙස ගත් සමාජයේම සාමූහික හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් යටතට ගෙන ඒම තුලින් පමනකි. මේ ප්‍රශ්නය 'කැපිටාල්' හි 3 වන වෙලුම තුල මාක්ස් මෙසේ ගෙනහැර දැක්වීය. "නිදහස....අන්තර්ගත විය හැක්කේ, සමාජීයවූ මිනිසා, හවුල් නිෂ්පාදකයා, ස්වභාවධර්මය සමඟ මිනිස් පරිවෘත්තිය බුද්ධිමත් ආකාරයකින් පාලනය කිරීම, අන්ධ බලවේගයක් ලෙස එය විසින් අධිකාරය දැරීම වෙනුවට එය ඔවුන්ගේ සාමූහික පාලනය යටතට ගැනීම, ශක්තියේ අවම පිරිවැයකින් හා ඔවුන්ගේ මානුෂික ස්වභාවය සඳහා වඩාත්ම යෝග්‍ය හා සරිලන කොන්දේසි සහිතව ඉෂ්ඨකර ගැනීම, යන මේ දෙය තුල පමනි." (3) අතීත අවධීන්හි දී නම් මාක්ස්ගේ එවන් ඡේද අනාගතය පිලිබඳ යම් වර්ගයක මනස්කල්පිත දෘෂ්ටියක් ලෙස සලකා පසුකර යා හැකිව තිබුනි. මෙහි ගෙනහැර දක්වා ඇති පර්යාලෝකය මත, ධනවාදය විසින් නිර්මානය කර තිබෙන ස්වභාවධර්මය හා මිනිසා අතර විභේදනය මඟින් ඇතිකල එන්ට එන්ටම වැඩී යන ගැටලු පොරබැදීම හා විසඳීම සඳහා පදනම සැකසිය යුතුය. මාක්ස් යල්පැන තිබීම කෙසේ වෙතත් සැබවින්ම කිවහොත් ලෝකය මාක්ස් වෙත ලඟාවී තිබේ.

මාක්ස්වාදයේ "හරිත" විරුද්ධවාදීන් විසින් ඉදිරිපත්කොට ඇති සියලු "විසඳුම්" තුල පහත සඳහන් පොදු දෙය දක්නට ඇත. එනම්, පෘතුවි ගෝලය උනුසුම්වීමේ ගැටලු විසඳීමේ ගාමක බලය ලෙස සමාජවාදී විප්ලවයේ මාධ්‍යයන් මඟින්, ධනවාදය පෙරලා දැමීමට ඔවුන් විරුද්ධ වන්නේ, එක්කෝ එය අයථාර්තවත් ය, නැතහොත් ඉක්මන් වැඩිය, හෝ සමාජවාදය ස්වභාවධර්මයට සතුරු යයි සමහර විට එල්ල කෙරෙන චෝදනා මතය. අවසන් විග්‍රහයේදී ඔවුන් ඉදිරිපත් කරන්නේ නිෂ්පාදන බලවේග, සියල්ලටත් වඩා මිනිස් ජනගහනයම, කප්පාදුකල යුතුය යන ඉදිරිදර්ශනයයි. වෙනත් වචන වලින් කිව හොත්, මාක්ස්වාදය හා නිෂ්පාදනයේ නව හා උසස් සමාජ සම්බන්ධතා පිහිටුවීම සඳහා වන එහි ක්‍රියාමාර්ගය ප්‍රතික්ෂේප කිරීමේ දී ඔවුන් ඓතිහාසිකව පෙල ගැසෙන්නේ ප්‍රතිගාමී පූජකයන් හා ධනවාදයේ ක්ෂමාලාපකයන් සමග ය. දහනමවෙනි සියවස ආරම්භයේ තෝමස් මෝල්තස්, ජනගහනය සමාජයට සපයාගත හැකි සම්පත් ඉක්මවා වැඩීගොස් ඇතැයි යන පදනම මත, මානව ප්‍රගතිය සඳහා ඇති බලාපොරොත්තු ඉවත දැමීමට උත්සුක විය.

මාක්ස්ගේ විශ්ලේෂනය පිලිබඳ අපගේ සමාලෝචනය, සියලුම ඊනියා වෙලඳපොල විසඳුම් මෙම අර්බුදය විසඳනවා වෙනුවට එය උග්‍ර කරන්නේ

මන් ද යන්න පැහැදිලි කරයි. සත්‍යය නම් මෙම පියවරයන් ඒවායේ මුහුනත ස්වරූපයෙන්ම විකාර සහගතය යන්නයි. අයිතීන් සහිත වෙලඳපොලක් නිර්මානය කිරීම හා එයට වායු දූෂනය සඳහා බලය පැවරීම මඟින්, වායු දූෂනය පිලිබඳ ගැටලුව විසඳිය හැකි යයි ඔවුහු කියා සිටිති. වෙනත් කිසිදු වෙලඳපොලක මීට පෙර කිසිදාක අත් නොදුටු යම් ආශ්චර්යයක් මඟින්, සියලු දෝෂ සහිත වාර්තා හා දූෂිත ක්‍රමවේදයන් කාබන් වෙලඳපොලෙන් අතුගා දැමුවත්, මූලික ගැටලුව ශේෂව පවතිනු ඇත. වෙලඳපොල සම්බන්ධතා පිලිබඳ පද්ධතිය පදනම්ව ඇත්තේ, නිෂ්පාදකයන් නිෂ්පාදන මාධ්‍යයන්ගෙන් වෙන්කිරීම මතය. අර්බුදයේ මූලාශ්‍රය වන්නේ, මිනිසා හා ස්වභාවධර්මය අතර පරිවෘත්තිය ලෙස දිස්වන මෙම වෙන්කිරීම ම ය.

## විද්‍යාව, තාක්ෂනය හා ධනවාදය

ගෝලීය ධනවාදයේ ව්‍යුහාත්මක අත්තිවාරම් පිලිබඳ විශ්ලේෂනය, ලාභ පද්ධතියේ සැකිල්ල තුල කිසිදු තාක්ෂනික විසඳුමක් ඇතිකල නොහැක්කේ මන්ද යන්න ද පැහැදිලි කරයි. මෙම ගැටලුව සමඟ පොර බදමින් එය විසඳීම සඳහා මාවතක් විවර කර ගැනීම පිනිස නව තාක්ෂනය වර්ධනය කිරීමට මානව වර්ගයාගේ විද්‍යාත්මක කුසලතාවය හා ධාරිතාවය ප්‍රමානවත් නොවන්නේ යයි මින් අදහස් නොකෙරේ. එහෙත් එවන් පියවර සඳහා වර්තමාන සමාජ පර්යාය තුල සාක්ෂාත් කල නොහැකි මට්ටමක, ගෝලීය සහයෝගීතාවක් හා සහභාගිත්වයක් විද්‍යාඥයින්, පර්යේෂකයන්, ආයතන හා සමස්තයක් ලෙස ජනගහනයම අතර තිබීම අවශ්‍ය කෙරේ. මොහොතක සලකා බැලීමකින් ඒ මන්ද යන්න පැහැදිලි වෙයි. මෙම ක්ෂේත්‍රයේ නව තාක්ෂනය ඉමහත් ලාභ ගැරීමේ මූලාශ්‍රය බවට පත් වනු ඇත. පරියේෂනවල ප්‍රතිපල හා තාක්ෂනික ජයග්‍රහන ඊර්ෂ්‍යා සහගත ලෙස රැකගනු ලබන්නේ ඒ නිසාය. එහෙත්, තොරතුරු නිදහසේ ගලායාමට හා පරියේෂනවල ප්‍රතිපල හරස්කොට බාධක ඉදිකරන තන්ත්‍රයන්, විද්‍යාවේ වර්ධනයට සතුරු ය. විශ්වවිද්‍යාල හා පරියේෂනායතන වලට ව්‍යාපාරික අනුග්‍රහය මත යැපීමට බලකෙරෙන කොන්දේසි යටතේ, තොරතුරු නිදහසේ බෙදී යාමක් සිදුවිය නොහේ. ප්‍රතිපල සඳහා ගෙවීම් කරන්නේ හරියට ම කවුරුන් විසින් දැයි යමෙකුට හරියට ම නිශ්චිත නැති තත්වයන් හමුවේ, පරියේෂනවල සොයාගැනීම් ද මුලුමනින්ම විශ්වාස කල නොහැක. අයිසැක් නිව්ටන් වරෙක මෙසේ පැවසීය. "මම දුර දිග දැක ඇත්තේ නම් ඒ, යෝධයන්ගේ කරමත මා සිටගෙන සිටි නිසාය" අද දිනයේ විද්‍යාත්මක පරියේෂන "පාච්චිච් කරන්නා ගෙවනු" යන මූලධර්මයට යටත්ය.

පෘතුවි ගෝලය උනුසුම්වීම මඟින් මානව ශිෂ්ඨාචාරයට එල්ල වී තිබෙන තර්ජනය ජයගැනීම, ජාත්‍යන්තර සමාජවාදය සඳහා අරගලය සමඟ නොවෙන්කල හැකි පරිද්දෙන් බැඳී ඇත. එය වනාහි, පෞද්ගලික හිමිකාරකමේ හා ජාතික රාජ්‍යයන්ගේ පද්ධතිය පෙරලා දැමීම මත පදනම්වූ ක්‍රියාමාර්ගයකි. ලෝක ආර්ථිකය සාමූහික නිෂ්පාදකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතට ගත යුතුය. වෙනත් වචනවලින් කිවහොත්, නිල් කරපටි, සුදු කරපටි, වෘත්තීයමය හා වෘත්තීයමය නොවන යනාදි වශයෙන් ජාත්‍යන්තර කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට යටත් කල යුතුය. තිරසාර පරිසරයක් සඳහා අවශ්‍යතාව ද ඇතුලු මිනිස් අවශ්‍යතා ඉටුකිරීම සඳහා එය පාලනය හා නියාමනය කල හැක්කේ එවිට පමනි. සමාජ හා ආර්ථික සම්බන්ධතා මත පවත්නා ලාභයේ ආඥාවන් පෙරලා දමා හේතු යුක්තියේ නියාමයන් ඊට ආදේශ කල යුතුය.

මෙම පර්යාලෝකයට මුහුනදුන් කල වර්තමාන පර්යායේ ආරක්ෂකයෝ බාධකයන් වෙත දුව යති. අතීතයේදී ඔවුහු දෙවියන්ගේ පිහිට පැතුහ. එය තව දුරටත් ශක්‍ය නොවන තතු හමුවේ ඔවුහු, ආර්ථිකයේ සවිඥානක පාලනයක් හා නියාමනයක් සරලව ම කල නොහැකි බව කියා සිටිති.

*ෆිනෑන්ෂල් ටයිම්ස්* ආර්ථික විශ්ලේෂක මාටින් වුල්ෆ් එවන් එක් ආරක්ෂකයෙකි. ඔහු දේශගුනික විපර්යාස මනින දර්ශකයක් හෝ ධනවාදී වෙලඳපොලේ අවිචේචනාත්මක ආරක්ෂකයෙකු නොවන අතර, ඔහු අවධාරනය කරන්නේ එය නිශ්චිත පාලනයකට යටත් කල යුතු බවයි. කෙසේ වෙතත් ඔහු කියා සිටින්නේ කුමන දෝෂ සහිත වුවත් එයට වෙනත් අර්ථ ක්‍රමයක් ආදේශ කල නොහැකි බවයි. බර්ලින් තාප්පය බිඳ වැටීමේ 20 වන සංවත්සරය නිමිතිකොටගෙන නොවැම්බර් 10 දින තීරුවක් ලියමින් ඔහු අවධාරනය කලේ, මෙම සිද්ධිය, "තර්කානුකූල සැලසුම්ගත ආර්ථිකයක් පිලිබඳ මිත්‍යාව අවසානයකට ගෙන ආ" බවයි. අප පැහැදිලි කර ඇති පරිදි, සෝවියට් සංගමයේ හා නැඟෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී ආර්ථිකයන් සමාජවාදී හෝ තර්කාන්විතව සැලසුම්කරන ලද ඒවා නොවීය. ඒ පිලිබඳ ප්‍රශ්නය ඉවත දැමීම මඟින් වුල්ෆ්ගේ ප්‍රකාශ වඩා පොදු ප්‍රශ්නයක් මතු කරයි.

ඔහු කියන දෙයෙහි ඇඟවුම් සලකා බලන්න. බිග් බෑන්ග් (මහා සට්ටනය) අවධිය කරා ද පසු පසට ගමන් ගනිමින් මානව වර්ගයාට, විශ්වයේ ඇත ම අහු මුලු පවා හාරා ඇවිස්සීමේ හැකියාව ඇත. මානව වර්ගයේම ජානමය ව්‍යුහය සිතියම්ගත කරමින් ක්ෂුද්‍ර මට්ටමේදී මනුෂ්‍ය වර්ගයා, ජීවිතයේ ව්‍යුහය කරා විනිවිද ගොස් තිබේ. ක්වොන්ටම් යාන්ත්‍රනය පිලිබඳ විද්‍යාව තුලින්, සංගීතය, සාහිත්‍යය හා චිත්‍රපට ගැන නොකීවත්, ගෝලීය පරිමාවකින් මුලුමනින්ම එක් ක්ෂනයෙන් තොරතුරු හුවමාරුව සඳහා කොන්දේසි නිර්මානය

කරමින්, පරිගනක හා තොරතුරු තාක්ෂනයේ ඉමහත් වර්ධනයක හැකියාව ගොඩනගා තිබේ. මනුෂ්‍ය වර්ගයාට මේ සියල්ල හා තවත් බොහෝ දේ කිරීමේ හැකියාව ඇතත්, මිනිස් අවශ්‍යතා ඉටුකිරීම සඳහා තමන්ගේ ම ආර්ථික හා සමාජ සංවිධානය, සවිඥානක පාලනයකට හා නියාමනයකට යටත් කල නොහැකිය. ආර්ථික හා සමාජ ජීවිතයේ සංවිධානය හැරෙන්නට, මානව ජීවිතයේ අන් සියලු ක්ෂේත්‍රයන් තුලට හේතු යුක්තිය පිලිබඳ නියාමයන් යෙදිය හැකි හා සැබවින්ම යෙදිය යුතුය යන වුල්ෆ්ගේ ප්‍රවාදය සරලව ම අභූතයකි.

ආර්ථිකය පිලිබඳ තර්කාන්විත ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, වෙලඳපොලේ අන්ධ භාවිතය අවසන් කරන්නේය යන්න, හුදු තෝරාගැනීම පිලිබඳ කාරනයක් නොවේ. එය අවශ්‍යතාවකි. ගෝලීය මූල්‍ය අර්බුදයේ ව්‍යුහය හා පරිසර විපර්යාස පිලිබඳ අර්බුදය අතර සමානකම මම පූර්වයෙන් සටහන් කලෙමි. මා එම ප්‍රශ්නය කරා යලි පැමිනිය යුතුය.

2007-08 වසරවල මූල්‍ය වෙලඳපොලවල ක්‍රියාකාරිත්වය මඟින් ලෝක ආර්ථිකය, මහා අවපාතයෙන් පසුව එලඹි බරපතලම අර්බුදය තුලට ඇද දමනු ලැබිනි. හදිසියේම ලොව පුරා බිලියන ගනනක් ජනතාවගේ ජීවිත තර්ජනයට ලක්විය. එසේම අර්බුදය එහි අවසානයේ අහලකටවත් පැමින නැත. සැබවින්ම, ඊටත් වඩා විනාශකාරී ශක්‍යතාවය සහිත තවත් මූල්‍ය කුනාටු එලඹෙමින් තිබෙන බවට පැහැදිලි ඇඟවුම් තිබේ. ඒ සමග ම, සෑම දෙසකම ආන්ඩු පලමු වටයේ බැංකු ඇපදීම් සඳහා ප්‍රදානය කල ඩොලර් බිලියන සිය ගනන් වෙනුවෙන්, කම්කරු පන්තිය හා සාමාන්‍ය ජනතාව මත බර පැටවීමට දැවැන්ත වියදම් කප්පාදු සූදානම් කරමින් සිටියි.

මෙම ව්‍යසනය හටගත්තේ කෙසේ ද? කිසිවෙකුටත් එය අවශ්‍ය නොවීය. කිසිවෙකුත් එය සංවිධානය කලේ ද නැත. එමඟින් වාසි ලබාගත හැකිවූ අය සම්බන්ධයෙන් පවා තත්වය එයයි. එය සරලව ම වෙලඳපොලේ ක්‍රියාකාරිත්වයෙන් පැන නැංගේය. එහෙත් වෙලඳපොල යනු කුමක් ද? එය මානව වර්ගයේ පාපයන් සඳහා කෙසේ හෝ ඊට දඬුවම් පැමිනවීමට මනුෂ්‍ය වර්ගයා මත කලින් කලට විනාශයන් පාත්කරන යම් වර්ගයක දුෂ්ඨ ලෝක ආත්මයක් නොවේ. වෙලඳපොල යනු, සමස්තයක් ලෙස මානව සංහතියේ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිපලයයි. එහෙත් එය, කිසිවෙකුගේ සවිඥානක පාලනයෙන් පරිබාහිරව, සමාජය මත පාලනය ගෙනයයි. අපගේ අදහස් ප්‍රකාශ කිරීමේ මාදිලිය මෙය පිලිබිඹු කරයි. නිරන්තරයෙන් කාලගුන අනාවැකි කෙරෙහි අවධානය යොමු කරන අපි වෙලඳපොල ගැන කථා කරමින් ඒ හෝ මේ දෙයක යෙදී සිටින්නෙමු. ආර්ථික ක්ෂිතිජයේ වලාකුලු, ගොනුවෙන කුනාටු යනාදිය ගැන.

දේශගුනික විපර්යාසයන්ගේ ස්වරූපය ද එසේම ය. තමන්ට පාලනයක් නොමැති, තමන්ගේම ආර්ථික කටයුතුවල ප්‍රතිපල මඟින්, මානව වර්ගයා තර්ජනයට ලක්වෙයි. අද දින කෝපන්හේගන් සමුලුව තුල මුලුදෙන ඊනියා ලෝක නායකයන්ට, හරිතාගාර වායු නිකුතුව අවම කර ගැනීමේ ගිවිසුමකට එලඹීමට අව්‍යාජ ඕනෑකමක් ඇතැයි අපි නිකමට සිතමු. එහෙත් ඔවුන් ප්‍රධානත්වය උසුලන ආර්ථික පද්ධතියේ ව්‍යුහය නිසා ඔවුන්ට එය කරගැනීමට නොහැකි වෙයි. කෝපන්හේගන් නස්පැත්තිය වනාහි මානව ශිෂ්ඨාචාරයේ පැවැත්මට එල්ල වන ඉමහත්ම තර්ජනය බවට මෙම පද්ධතිය පත්ව ඇතැයි යන්න පිලිබඳ තවත් ඇඟවුමක් පමනි. එය පෙරලා දැමිය යුතුය.

එහෙත් අපට දැන් මුනගැසෙන්නේ, සමාජවාදයේ අවශ්‍යතාව ගැන අපගේ පොදු විග්‍රහය සමඟ එකඟ වන බව පවසන නමුත්, එය බොහෝ කාලයක් ගතවන දෙයක් වන බැවින් "මේ දැන්" යමක් කල යුතු බව අවධාරනය කරන අයගේ තර්කයයි. පොදු අරමුනක් ලෙස සමාජවාදය බොහෝ මනාප හා හොඳ දෙයක් වන නමුත්, සමාජවාදී ඉදිරිදර්ශනයක් සඳහා සටනට, වහාම පොර බැදිය යුතුව ඇති පාරිසරික වෙනස්කම් වැනි ගැටලු සමඟ හැප්පීමට නුපුලුවන. එවන් තර්ක සාමාන්‍යයෙන් ඉදිරිපත් කරන්නේ "යථාර්තවාදය" නමැති බැනරය යටතේය. සැබවින්ම ඔවුන් දරා සිටින්නේ වඩාත්ම අයථාර්තවත් ඉදිරිදර්ශනයයි. පාරිසරික විපර්යාස බලගතු තර්ජනයක්ව ඇති බවත්, එය ඉතා වැදගත් ප්‍රශ්නයක් බවත්, එයට යමක් කලයුතු බවත් කෝපන්හේගන් සමුලුව නිසැකව ම ප්‍රකාශයට පත්කරනු ඇත. සැබවින්ම එය බරපතල ය. ඒ නිසාම ඔවුන් ඒ ගැන සාකච්ඡා කිරීමට ලබන වසරේ මෙක්සිකෝහි දී යලිත් සමුලුවක් කැඳවනු ඇත!

ධනවාදය පෙරලා දැමීම හා සමාජයේ සමාජවාදී පරිවර්තනයක් ඇති කිරීම පහසු දෙයක් නොවනු ඇත. එය බොහෝ හැරීම් හා පැද්දීම් වලට මුහුන දෙනු ඇත. මානව ඉතිහාසය තුල මුහුනදෙන අතිශයින්ම දුෂ්කර හා සංකීර්න කර්තව්‍යය වන බැවින් එය, කැපකිරීම් හා බැඳීම් ඉල්ලා සිටිනු ඇත. එහෙත් එය දුවවනු ලබන්නේ ධනේශ්වර පද්ධතියේ හදවතෙහිම පවතින බලගතු හා නොවිසඳිය හැකි ප්‍රතිවිරෝධයන් මඟින්ය. එය වනාහි, වරෙක මානව ශිෂ්ඨාචාරය වැඩි වර්ධනය කිරීම සඳහා තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටුකල එහෙත්, දැන් වචනාර්ථයෙන්ම එය විනාශ කිරීමට තර්ජනය කරන පද්ධතියකි. යථාර්තවාදය! කෙසේ හෝ, කුමන මාර්ගයකින් හෝ, සෑහෙන තරම් පීඩනය යෙදුවහොත් ඊලඟ පරම්පරාවට හා ඉදිරියේ එන සියලු පරම්පරාවන්ට අනාගතයක් සැපයෙන පරිදි ධනේශ්වර ක්‍රමය ප්‍රතිසංවිධානය කල හැකි යයි විශ්වාස කිරීම බෙහෙවින්ම අයථාර්තවත්ය.

ප්‍රශ්නය පිලිබඳව මාක්ස්ගේ සමාප්තියෙන් අවසන් කිරීමට මට ඉඩ දෙන්න. "ඉහල සමාජ-ආර්ථික සැකැස්මක් පිලිබඳ දෘෂ්ටි ආස්ථානයෙන් ගත් කල, මිහිතලය මත විශේෂිත පුද්ගලයන්ගේ පුද්ගලික දේපල, අනෙක් මිනිසුන් එක් මිනිසෙකුගේ පුද්ගලික දේපල බවට පත්වීම සේම විකාර සහගත බව පෙනී යනු ඇත. සමස්ත සමාජයක්ම, ජාතියක්ම හෝ සියලු සමාජයන් එකවිට එකට ගත් විට පවා, ඒවා මිහිතලයේ හිමිකරුවන් වන්නේ නැත. එවා හුදෙක් එය බුක්තිවිඳින්නන් ය, එහි වාසි ලබන්නන් ය. එසේම හොඳ *ගෘහමූලිකයෙක්* මෙන් ඉදිරි පරම්පරාවන් සඳහා එය වැඩි දියුනු තත්වයකින් උරුමකර දෙන්නවුන් ය." (4) අපගේ පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා සමාජවාදී සමානතා පක්ෂය සටන්වදින ක්‍රියාමාර්ගයේ පදනම මත පමනක් එවන් ඉදිරිදර්ශනයක් සාක්ෂාත් කල හැකිය. මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ එහි සාමාජිකත්වයට එක්වන ලෙසයි.

**සටහන් :**

1. *CAPITAL, vol 1*, (ප්‍රාග්ධනය) 1 වෙලුම, 637 පිටුව.

2. එම,

3. *CAPITAL, vol 3,* (ප්‍රාග්ධනය) 3 වෙලුම, 959 පිටුව.

4. එම, 911 පිටුව.

© www.wsws.org